# 2018 මැයි මස මාසික සභා රැස්වීම

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2018 මැයි මස මාසික සභා රැස්වීම 2018.05.03 වන දින පෙ.ව.10.30 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබීය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු උප සභාපති - ඩබ්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඒ.ගුණතිලක මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ආර්.රත්නපාල මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත කුසුම් කුමාර මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.ආර්.ප්‍රසාද් අසිත මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඒ.ඩබ්.සුමනාවතීමැතිතුමිය
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා

## නිලධාරී සහභාගීත්වය

1. ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.රත්නාවතී මැණිකේ මෙනවිය
2. කළමනාකරණ සහකාර - එච්.ඒ.පී.එන්.හෙට්ටිආරච්චි මිය

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපති තුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්යමණ්ඩලයත්,මාධ්‍යවේදී මහතාත් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

## 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම

2018.04.05 වන දින පැවති මාසික සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිසිර ප්‍රේමකුමාර මැතිතුමාවිසින් කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

## 2. <u>ගරු සභාපති තුමාගේ නිවේදන</u>

I. පළාත් පාලන ආයතන වලට තේරී පත් වූමහජනනියෝජිතයින් දැනුවත් කිරීමේ එක් දින වැඩසටහනක් හා තෙදින නේවාසික වැඩමුළුවක් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මඟින් ඉදිරියේදී සංවිධානය කරන බව දන්වා ඇති බව ගරු සභාපති තුමා විසින් නිවේදනය කරන ලදී.

II. පළාත් පාලන ආයතනයන්හි සභා කටයුතු සම්බන්ධව දේශපාලන නායකත්වය විසින් අනුගමනය කල යුතු ක්‍රියා පටිපාටිය පිළිබඳ දැණුවත් කිරීමේ වැඩසටහනක් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2018.05.05 වන දින පෙ.ව.9.00 සිට ප.ව.1.00 දක්වා රත්නපුර නව නගරයේ කේතුමතී උත්සව ශාලාවේදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති අතර ඒ සඳහා ගරු සභාපතිතුමන්ලා හා උප සභාපතිතුමන්ලා පමණක් සහභාගී වන බව දන්වන ලදී.

III. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය අසනීප වීම හේතුවෙන් අද දින සභා රැස්වීමට සහභාගී නොවන බව ගරු සභාපති තුමා විසින් සභාවට දැණුම් දෙනු ලදුව,එතුමියගේ නිවාඩුව අනුමත විය.

## 3. සභාව නමින් ලැබී ඇති ලිපි, පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම

### I. <u>මාර්ගයක් කොන්ක්‍රීට් කර ගැනීම සම්බන්ධවයි</u>

වැලිගෙපොල පිටකන්ද ප්‍රදේශයේ පදිංචි පී.ජී.ඩිංගිරි මහත්තයා මහතා විසින් ප්‍රදේශවාසීන්ගේ අත්සන් ලේඛනයක්ද සහිතව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමාවෙත ඉදිරිපත් කර ඇති 2018.03.05 වන දිනැති ලිපිය ගරු මන්ත්‍රීතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

එකී ලිපියෙන්වැලිගෙපොල ග්‍රාම නිලධාරී වසමේ පිටකන්ද, පල්ලෙවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා මීට පෙරද ඉල්ලීම් කර ඇතත්,ඒ සඳහා මේ වන විටත් කිසිදු පියවරක් නොගත් බවත්,සැතපුම් එක හමාරක් පමණ වන මෙම මාර්ගයේ හැකි ප්‍රමාණයක් හෝ කොන්ක්‍රීට් කර දෙන ලෙසටත් ලිපියේ සඳහන්ව ඇත.

### II. <u>වැලිගෙපොල උප කාර්යාලයේ සේවා කටයුතු විධිමත් කිරීම</u>

ඕපනායක පිහිටි ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයට යාමට ඒමට නොහැකි වැලිගෙපොල ප්‍රදේශයේ ජනතාවට මහගු සම්පතක් වූ වැලිගෙපොල උප කාර්යාලයේ සේවා කටයුතු විධිමත් කරන ලෙසත් එහි භෞතික සම්පත් හා මානව සම්පත් වැඩිදියුණු කරන ලෙසත් ඉල්ලා වැලිගෙපොල බදු ගෙවන්නන්ගේ එකමුතුව විසින් සභාවට යොමු කරන ලද 2017.12.20 දිනැති ලිපිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

## 4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ

ගරුප්‍රාදේශීයසභාමන්ත්‍රීඑල්.ඒ. ගුණතිලකමැතිතුමා විසින් වාචික පිළිතුරු අපේක්ෂාවෙන් පහත සඳහන් කරුණු ගරු සභාපති තුමා වෙත ඉදිරිපත් කරන ලදී.

I. ප්‍රශ්නය - මෑතකදී ගලවා ඉවත් කරනු ලැබූ වීථි පහන් නැවත සකස් කිරීමට හා දැනට අක්‍රීයව ඇති වීථි ලාම්පු යථාතත්වයට පත් කරන්නේද?

   පිළිතුර - වීථි ලාම්පු සවි කිරීම ක්‍රමක්‍රමයෙන් සිදුකරමින් පවතී.

II. ප්‍රශ්නය- සුසාන භූමි සහිත ඉඩම් නිරවුල් කර ගැනීමට කටයුතු කරන්නේ ද?

   පිළිතුර - වැලිගෙපොල ප්‍රාදේශීය ලෙකම් කොට්ඨාශය තුල පවතින ඉඩම් බිම් සවිය වැඩසටහන යටතේ මැණුම් කර ඇති බැවින්,ඒ සම්බන්ධයෙන් ගැටළුවක් නොපවතින අතර,ඕපනායක සහ වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ සාකච්ඡා කර අදාල කටයුතු සිදුකිරීමට කටයුතු කරමි.

## 5. කල් දී ඇති යෝජනා

### 5.1.ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

I. පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිතව ලෝක බැංකු ආධාර යටතේ පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ලෝක බැංකු වැඩසටහන සඳහා බල ප්‍රදේශය තුල කිසිදු සංවර්ධන යෝජනාවකට ඇතුලත් නොවුන,එහෙත් අත්‍යාවශයෙන්ම සංවර්ධනය කල යුතු මාර්ග 05ක් හදුනාගෙන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු බවත්,ඒ අනුව පළාත් පාලන කොමසාරිස්ගේ ලිපියෙහි ඇතුළත් නිර්නායකයන්ට අනුකූලව පහත සඳහන් මාර්ග සංවර්ධන යෝජනා එම වැඩසටහනට ඇතුලත් කිරීම සුදුසු බවත් ගරු සභාපති තුමා විසින් යෝජනා කරන ලදී.

- උඩගම හපුගස්තැන්න මාර්ගය
- පැලැන්දකන්ද කැන්දකැටිය මාර්ගය
- නැකැත්වලකඩ උඩරංවල මාර්ගය
- හත්තැල්ල පන්නිල මාර්ගය
- ඉළුක්කුඹුර මැද්දේකන්ද ගල්ලින්න මාර්ගය

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමාවිසින් ස්ථිර කරන ලදී.

සභා බල ප්‍රදේශය තුල මාර්ග නඩත්තු කිරීමේ කටයුතු සිදු කිරීමේ අවශ්‍යතාව පැන නැගුනත් මාර්ග කම්කරුවන් අවශ්‍ය ප්‍රමාණයට නොමැති වීම නිසා එම කාර්ය අඩාලව පවතින බවට ගරු සභාපතිතුමා විසින් අදහස් දක්වමින් කුලී පදනම මත හෝ කම්කරුවන් ලබා ගැනීමේ අවශ්‍යතාව පෙන්වා දෙන ලදී.ඒ අනුව කටයුතු කිරීමට සභාවේ එකඟතාවය පල වූ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ මන්ත්‍රීතුමා විසින් අදහස් දක්වමින් ඒ ඒ කොට්ඨාශ තුල මාර්ග ශ්‍රම දායකත්වයෙන් පිළිසකර කර ගැනීම සඳහා කම්කරුවන් සමඟ JCB යන්ත්‍රයද ලබා දෙන ලෙසට කරන ලද ඉල්ලීමටද සභාවේ එකඟතාවය ප්‍රකාශ විය.

II. ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන 2018 සඳහා මෙම සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීමට පහත සඳහන් ව්‍යාපෘති යෝජනා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමුකිරීම සුදුසු බව ගරු සභාපති තුමා විසින් යෝජනා කරන ලදී.

| | | |
|---|---|---|
| 1. | වැලිගෙපොල සති පොළේ කාණුව අළුත්වැඩියා කිරීම | රු. 150,000/= |
| 2. | ඕපනායක සති පොළ සංවර්ධනය කිරීම | රු. 780,000/= |
| 3. | මුත්තෙට්ටුපොල පෙර පාසලේ වහලය අළුත්වැඩියා කිරීම | රු. 145,000/= |
| 4. | ලියන්වින්න ජල ව්‍යාපෘතිය අළුත්වැඩියා කිරීම 11 අධියර | රු. 1,950,000/= |
| 5. | ගල්පාය සාප්පු සංකීර්ණය අළුත්වැඩියා කිරීම | රු. 250,000/= |
| 6. | කරගහයට ජල පොම්පාගාරය අළුත්වැඩියා කිරීම | රු. 725,000/= |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්ලිව්.ජී.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

III. ඉඹුල්තැන්න ක්‍රීඩා පිටිය මෙම සභාවට පවරා ගැනීමටත්,ළමා උද්‍යානයක් සහිතව ක්‍රීඩා පිටිය වැඩිදියුණු කර ප්‍රවේශ මාර්ගය අඩි 20 ක් දක්වා පළල් වන ආකාරයට සංවර්ධනය කිරීමත් සුදුසු බව යෝජනා කරන ලදී.

IV. උතුරු හුණුවල ජල ව්‍යාපෘතියේ ජල මෝටර් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වැය වන විදුලි බිල්පත් පියවීමට මාසිකව විශාල මුදලක් වැය කිරීමට සිදුවන බැවින් ,එමගින් සභාවට වන පාඩුව අවම කර ගැනීම සඳහා උතුරු හුණුවල ජල යෝජනා ක්‍රමයට අලුතින් සුදු හීන්කන්ද සිට ජලනල පද්ධතියක් එලීම සුදුසු බවයෝජනා කරන ලදී.

V. සභාව සතු පෙළෙහෙවත්ත හා ඕපනායක සති පොළ ඉදිරිපිට තාවකාලිකව ඉදිකර ඇති කඩ කාමර වෙනුවට ස්ථිර කඩ කාමර ඉදි කිරීම සහ වැලිගෙපොල සහ අම්බැවිල සති පොළ ඉදි කිරීම කාලීන අවශ්‍යතාවක් බව පෙන්වා දුන් ගරු සභාපතිතුමා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ප්‍රතිපාදන සලසාගෙන කඩ කාමර ඉදි කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

VI. සභා රැස්වීම් කටයුතු පැවැත්වෙන අවස්ථාවලදී සංග්‍රහ කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය උපකරණ (ටී සෙට්,වීදුරු සෙට්,ජෝග්ගු) ලබා ගැනීම සුදුසු බව යෝජනා කරන ලදී.

VII. ප්‍රාදේශීය සභාවේ ජල ව්‍යාපෘති සඳහා ජල මීටර් ලබා ගැනීමේ අවශ්‍යතාවය පැන නැගී ඇති බැවින් ජල මීටර් 300 ක් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

VIII. ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාලය සඳහා අවශ්‍ය ලී පොත් රාක්ක 02 ක් සහ පුවත්පත් රඳවා තැබීමට කබඩ් 01 ක් සදා ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම සුදුසු බවත්,පුස්තකාල සංවර්ධන අරමුදල සඳහා පෝස්කාඩ් ප්‍රමාණයේ කාඩ් පත් 1000 ක් මුද්‍රණය කර ගැනීම අවශ්‍ය බවත්,යෝජනා කරන ලදී.

IX. PF 5490 දරණ කැබ් රථය වෙනුවෙන් රජයේ විවිධ නීතිගත සංස්ථාවෙන් ටයර් හතරක් මිලදී ගැනීම අවශ්‍ය බවත්,යෝජනා කරන ලදී.

ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහන විජේරත්න මැතිතුමා ප්‍රකාශ කර සිටියේ සුදුහීන්කන්ද සිට ජල නල පද්ධතියක් එළීමෙන් ගොවීන්ගෙන් විරෝධතාවක් මතු විය හැකි බවයි,ගොවිජනතාව අපහසුතාවට පත් නොවන ආකාරයට වර්ෂා කාලයේ දී පමණක් ජලය ලබා ගත හැකි පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන බවත් එමගින් ජල මෝටර් බිල්පත් සඳහා යන වියදම අවම කර ගත හැකි බවත් පැවසූ ගරු සභාපතිතුමා මෙම කාරණය සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ අවධානය යොමු කර තීරණයක් ගන්නා බවද පැවසීය.

දීර්ඝ කාලයක සිට සභාව විසින් බුක්ති විඳින ලද අම්බැවිල ඉඩම් කොටස සමෘද්ධි කාර්යාලය ඉදි කිරිම සඳහා ලබා දෙන ලෙස ඉල්ලීමක්වැලිගෙපොල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී ඉදිරිපත් වී තිබුණද එම ඉඩම් කොටස උපයෝගී කර ගනිමින් සතිපොළක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පහසුකම් ඇති කිරිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් පෙන්වා දෙන ලදී.එහි දී අදහස් පල කල ගරු සභාපති තුමා කියා සිටියේ එම ඉඩම තවමත් වෙනත් ආයතනයකට පවරා දී නොමැති බවයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා නැවතත් අදහස් පල කරමින් ,ඉඹුල්තැන්න ක්‍රිඩා පිටිය සහිත ඉඩම සභාවට පවරා දී තිබේද? යන පැනයට පිළිතුරු දෙමින් ගරු සභාපති තුමා පවසා සිටියේ සබරගමු මහ සමන් දේවාලය හා ඉඩම් කොමිෂන් සභාව අතර නඩුවක් පැවතීම හේතුවෙන් එම පවරා ගැනීම ප්‍රමාදව ඇති බවත්,සමන් දේවාලයේ හා ඊට අදාල අනෙකුත් එකඟතා හා නීතිමය අවශ්‍යතා සපුරාගෙන ඉඩම් අමාත්‍යාංශය හරහා පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බවත්ය.

තවද, වැලිගෙපොල සතිපොළ සංවර්ධනයේදී අනවසර ඉදිකිරීම් ඉවත් කල යුතු බව හා ඒවා ඉවත් කිරීමට නීතිමය බාධාවක් නොමැති බවට සභාවේ කරුණු සාකච්ඡා වූ අතර ,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා අදහස් දක්වමින් ,එහි රැඳී සිටින වෙළෙන්දන්ට වෙළඳ බලපත්‍රයක් ලබා දීමේ ගැටළුවක් නොපවතින අතර,එකී බලපත්‍රය ලබා ගැනීම ඉඩම්වල අයිතිය ප්‍රකාශ කිරීමේ තහවුරුවක් නොවන බවද පෙන්වා දීමෙන් අනතුරුව ගරු සභාපති තුමා විසින් ඉදිරිපත් කල යෝජනා සභාවේ ඒකමතික එකඟතාවයෙන් යුතුව සභා සම්මත විය.

## 5.2.ගරුප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් හුණුවල කොට්ඨාශයේ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කල යුතු පහත සඳහන් යේජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. පොල්වත්තහේන සහ හල්ලින්න ග්‍රාමනිලධාරී වසම් දෙකේ සියළුම පවුල් සඳහා ජල යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරිම.

II. දුණුකාරගොඩ, මල්මීකන්ද, හේනයාය දක්වා මේවන විට ලබා දී ඇති ජල යෝජනා ක්‍රමය සංවර්ධනය කිරීම.

III. උතුරු හුණුවල, දකුණු හුණුවල වසම් දෙක සඳහා ජලය ලබා දෙන ජල යෝජනා ක්‍රම වැඩි දියුණු කිරීම.
IV. වතුකන්ද ගමේ අඩක් වැඩ අවසන්ව ඇති ක්‍රීඩා පිටියේ ඉතිරි කොටස කැපීම.
V. හල්ලින්න වතුයායේ ක්‍රීඩා පිටියේ ඉතිරි කොටස කැපීම.
VI. හල්ලින්න පොදු සුසාන භූමිය අසල ප්‍රජා ශාලාවක් ඉදි කිරීම සඳහා ගෙපල කැපීම.
VII. කොට්ඨාශයේ පොදු සුසාන භූමි අවශ්‍ය කරන ගම්මාන සඳහා සුසාන භූමි ඇති කිරීම.

මෙම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම සභා බල ප්‍රදෙශය තුල ඇති ප්‍රජා ජල ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේ දී පවතින ගැටළු සම්බන්ධයෙන් සභාවේ කතිකාවට ලක් වූ අතර බල ප්‍රදෙශය තුල ක්‍රියාත්මක වෙන ප්‍රජා ජල ව්‍යාපෘති බොහොමයක් දැනට අක්‍රිය වී ඇති බැවින් ,ඒවා ප්‍රජා අවශ්‍යතාවන්ට ගැලපෙන අයුරින් ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාව පිළිබඳව සාකච්ජා වූ අතර,ප්‍රජා ජල භාරකරුවන්ගේ අත්තනෝමතික ක්‍රියාවන් නිසා ගැටළු පැන නැගී ඇති බවත්,ඒවා විධිමත් කර පාලනයකින් යුතුව ජලය බෙදා දීමේ වැඩ පිළිවෙලක් ඇති කිරීම සඳහා ජල සමිති සක්‍රිය කිරීමේ අවශ්‍යතාව පිළිබඳවත් මෙම අවස්ථාවේ අදහස් හුවමාරු විය.

එකී සකච්ජාවෙන් අනතුරුව ගරුමන්ත්‍රීතුමා විසින් කරන ලද යෝජනා සියල්ල සභා සම්මත විය.

## 5.3.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා

I. අක්‍රියව ඇති විදුලි පහන් වෙනුවට නව විදුලි පහන් සවි කිරීම අවශ්‍ය බවත්,
II. කසළ ප්‍රවාහන ට්‍රැක්ටරය අම්බැවිල මංසංදිය දක්වා දීර්ඝ කිරීම සුදුසු බවත්,
III. මඩ වගුරක්ව පවතින තලගස්කන්ද ක්‍රීඩා පිටිය සභාවට පවරා ගෙන සංවර්ධනය කිරීම හා,
IV. තලගස්කන්ද වසමේ අක්‍රීයව පවතින ජල ව්‍යාපෘතිය යලි ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමාවිසින් යෝජනා කරන ලදුව ,එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ. ගුණතිලක මැතිතුමාවිසින් ස්ථිර කරන ලදී.

කසල ඉවත් කිරීමේ සේවාවෙහි යොදවා ඇති ට්‍රැක්ටර් රථවල අළුත්වැඩියාවන්,ඉන්දන වියදම් සහ රියදුරන්,කම්කරුවන්ගේ වැටුප් හා දීමනා වෙනුවෙන් වර්ෂයකට සභාව විසින් විශාල වියදමක් දැරීමට සිදුවන අතර දැනට කසල කළමනාකරණයකට භාජනය නොවීම නිසා අවසාන බැහැරලීම සම්බන්ධව ගැටළු පැවතීම නිසා කසල ඉවත් කිරීමේ සේවාව දීර්ඝ කිරීම සොයා බැලිය යුතු බවටකරුණු අනාවරණය කළ ගරු සභාපති තුමා,ගරු මන්ත්‍රී තුමා විසින් ඉදිරිපත් කල යෝජනා සම්බන්ධවද දීර්ඝව සාකච්ජා කිරීමෙන් අනතුරුව,තලගස්කන්ද වසමේ අක්‍රියව පවතින ජල ව්‍යාපෘති පිළිබඳව ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමටද තීරණය කරන ලදී.තලගස්කන්ද ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම පිළිබඳව සිය අවධානය යොමු කරන බව මෙහි දී ගරු සභාපතිතුමා ප්‍රකාශ කළේය.

## 5.4.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ. ගුණතිලක මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් බෝපිටිය,කෝන්ගස්තැන්න,ගල්ගොඩගම,ඉළුක්කුඹුර සහ පරගහමඩිත්ත ග්‍රාම නිලධාරී වසම් වල අත්‍යවශයෙන්ම සංවර්ධනය කල යුතු පහත සඳහන් මාර්ග සංවර්ධන යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී

I. බලගහවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම.
II. කෝන්ගස්තැන්න වසමේ පානීය ජල සැපයුම විධිමත් කිරීම.
III. සඳගනාගම ක්‍රීඩා පිටිය සංවර්ධනය.
IV. ඇහැළකුඹුර මාර්ගය කොන්ක්‍රීට් කිරීම.
V. පල්ලන්ද ග්‍රාමය ඉළුක්කුඹුර - පනාන ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වන මාර්ගය සංවර්ධනය කිරීම.
VI. කන්ද මාර්ගය කොන්ක්‍රීට් කිරිම
VII. බන්දුකන්ද මාර්ගය සංවර්ධනය කිරිම
VIII. ඉදිගොඩඇළ මාර්ගය කොන්ක්‍රීට් කිරිම
IX. ලන්දෙවත්ත මංසන්ධිය අසල පැති බැම්මක් ලබා දීම
X. ලක්ෂ්මිඅරාව ඉහළ සහ පහළ කොටස් දෙක කොන්ක්‍රීට් කිරිම
XI. පින්නගල එපිටවත්ත මාර්ගය සංවර්ධනය කිරිම
XII. මැදගංඔය මාර්ගය සංවර්ධනය කර අඩි 100 ක් කොන්ක්‍රීට් කිරිම

ඉහත යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව,ගරු මන්ත්‍රීතුමා අදහස් දක්වමින් සභාව සතු JCB යන්ත්‍රය මාර්ග සංවර්ධනය සඳහා ලබා ගත හැකිද යන්න විමසීමේදී ගරු සභාපති තුමා පවසා සිටියේ ශ්‍රමදාන මට්ටමින් අවශ්‍ය සහය ගම්වාසීන්ගෙන් ලබාගෙන JCB යන්ත්‍රය යොදා අත්‍යාවශ්‍යයෙන් සකස් කල යුතු ස්ථාන සකස් කිරීමට කටයුතු සලසා දියහැකි බවයි.

ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සඳගනාගම ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු ශ්‍රීමාවතී මන්ත්‍රීතුමිය පවසා සිටියේ,අදාල ක්‍රීඩා පිටියේ අක්කර කාලක පමණ කොටසක් මිනිසුන් විසින් අත්පත් කරගෙන බුක්තිවිඳින බවත් ඒ සම්බන්ධව තමන් මෙවර සම්බන්ධීකරණ කමිටු රැස්වීමට දන්වා සිටින බවත්,එහි දී සියළු මන්ත්‍රීවරුන්ගේ සහය තමාට ලබා දෙන ලෙසත්,ඉල්ලා සිටින ලදී.වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමිය විමසා සිටියේ එම ක්‍රීඩා පිටියේ අයිතිය නිවාස සංවර්ධන අධිකාරිය සතුව පවතින බැවින් එය සංවර්ධනය කිරීමේ හැකියාවක් සභාව සතුව පවතින්නේ ද යන්නයි.
එහි දී ගරු සභාපති තුමා ප්‍රකාශ කර සිටියේ එම ක්‍රීඩා පිටිය නිවාස සංවර්ධන අධිකාරියෙන් ඉල්ලීමක් කර සභාවට පවරා ගැනීම කාලෝචිත බවයි, එය සභාවට පවරා ගතහොත් පක්ෂග්‍රාහී නොවන අයුරින් සාධාරණව කටයුතු කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ශ්‍රීමාවතී මන්ත්‍රීතුමිය ගරු සභාපති තුමාගෙන් ඉල්ලා සිටින ලදී.

## 5.5.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා

I. හඳගිරිය, හඳගිරිගොඩ මාර්ගයේ වීදි ලාම්පු අළුත්වැඩියා කිරිම සහ නව ලාම්පු සවිකිරිම සුදුසු බව,
II. සඳගනාපුර මාර්ගයේ කාණු පද්ධතිය සැකසීම සඳහා JCB යන්ත්‍රය ලබා දීම.
III. බෙලිමාලියද්ද වසමේ පැපොල්වත්ත මාර්ගයේ බෝක්කුවක් දැමීම හා පාර කොන්ක්‍රීට් කිරිම
IV. සුවඳනෙළුම්ගම මාර්ගය කොන්ක්‍රීට් කිරිම

ඉහත යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදි.

අනතුරුව අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා හඳගිරිය,හඳගිරිගොඩ වසම් වල අලි මිනිස් ගැටුම් බහුලව පවතින බවත්,එම ප්‍රදේශ වාසීන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටළු රාශියක් උද්ගතව ඇති බවත් පවසමින්,වීථි පහන් සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති යෝජනා සඳහා විශේෂ අවධානය යොමු කරන ලෙසත්,පාසල් ළමුන් ඇතුළු අනෙකුත් මගීන්ට දැඩි ලෙස ගමන් අපහසුතා ඇති මාර්ග සංවර්ධනය කිරීමට සභාවේ අවධානය යොමු කරවන ලෙසත් ඉල්ලා සිටින ලදී.

## 5.6.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා

ඉහත ගරු මන්ත්‍රීතුමා විසින් පහත සඳහන් යෝජනව සභාවට ඉදිරිපත් කරන ලදී,

I. වැලිගෙපොල වීරසේකර මුදලින්දාරාම විහාරස්ථානයේ පැවැත්වීමට නියමිත වාර්ෂික පොසොන් පෙරහැර සඳහා සභා අරමුදලින් රු.50,000/= ක මුදලක් දායක සභාව වෙත ලබා දීම සුදුසු බව මෙම ගරු සභාව වෙත යෝජනා කරමි.

ඉහතයෝජනාවගරුප්‍රාදේශීයසභාමන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමාවිසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ වැඩි දුරටත් කරුණු සාකච්ජා කරමින්,වැලිගෙපොල සති පොළ වීරසේකර මුදලින්දාරාම විහාරස්ථානයට අයත් ඉඩමක පවත්වාගෙන යන අතර එ් වෙනුවෙන් සභාව මඟින් කිසිදු බදු මුදලක් නොගෙවන බැවින්, වාර්ෂික පොසොන් මහා පෙරහැර සඳහා රු.25,000/= ක් පරිත්‍යාග කිරීම සුදුසු බව තීරණය කරන ලදී,අනතුරුව එම යෝජනාව සබරගමු පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා ගැනීම පිණිස පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීම සුදුසු බවද, තීරණය කරන ලදුව එම යෝජනාවට සභාවේ එකමතික අනුමැතියලැබිණ.

## 5.7.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් අකරැල්ල ප්‍රදේශයේ ජනතාවගේ පොදු පහසුකම් වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදුව එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මන්ත්‍රීතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව සභාවේ ඒකමතික එකඟතාවෙන් යුතුව සභා සම්මත විය.

I. අකරැල්ල කියවීම් ශාලාව එම විහාරස්ථාන භූමියේම වෙනත් ස්ථානයක ඉදිකිරීම
II. අකරැල්ල කොට්ඨාශයේ වීථි පහන් සවිකිරීම
III. අකරැල්ල වොලිබෝල් ක්‍රීඩා පිටිය අසල මාර්ගය අළුත්වැඩියා කිරීම
IV. හත්තැලිහෙල මාර්ගය සහ වල්ලකැටිය මාර්ගය සුද්ධ පවිත්‍ර කිරීම

## 5.8.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත සඳහන් යෝජනා සභා ගත කරන ලදී.

I. රංවල ළහිරු පෙරපාසල් ගොඩනැගිල්ල අවදානම් තත්ත්වයක පවතින බැවින් එය අළුත්වැඩියා කිරීම
II. හාන්දුගම හෙවලාකන්ද මාර්ගයේ මුල කොටස කොන්ක්‍රීට් කිරීම
III. එළමල්පෙ මාතිගකුඹුර මාර්ගය කොන්ක්‍රීට් කිරීම

IV. එළමල්පෙ නියදගල මාර්ගය කොන්ක්‍රීට් කිරීම
V. එළමල්පෙ කුඩුගල්පල මාර්ගය කොන්ක්‍රීට් කිරීම
VI. මහතැන්න මාර්ගය කොන්ක්‍රීට් කිරීම
VII. දෙල්වලකන්ද ඇල්ලමණ්ඩිය මාර්ගය කොන්ක්‍රීට් කිරීම
VIII. අම්මඩුව දේවාලය ඉදිරිපිට යකුටුමුල්ල මාර්ගය කොන්ක්‍රීට් කිරීම
IX. වෙළගපල බෝධිගොඩ මාර්ගය කොන්ක්‍රීට් කිරීම
X. අම්මඩුව දියබෝල මාර්ගය කොන්ක්‍රීට් කිරීම
XI. වෙළගපල ප්‍රජා ශාලාව අළුත්වැඩියා කිරීම
XII. තැන්නහේන උපාලි මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගයට බෝක්කුවක් යෙදීම
XIII. තැන්නහේන ප්‍රජා ශාලාව අළුත්වැඩියා කිරීම
XIV. මහෝමාර තලගස්කන්ද මාර්ගයේ බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිරිපිට මාර්ගය පැත්තක් කඩාගන ගොස් ඇති බැවින් එයට ඉතා ඉක්මණින් පැතිබැම්මක් සකස් කිරිම
XV. රංවල උඩගම්මැද්ද මාර්ගය කොන්ක්‍රීට් කිරීම
XVI. දෙල්වලකන්ද පහල කොටසට ජල යෝජනා පද්ධතියක් ලබාදීම
XVII. දෙල්වලකන්ද ශ්‍රී සුමනාරාම දහම් පාසලට උපකරණ ලබාදීම (ඩෙස්/පුටු)
XVIII. සිරි සිදුහත් දහම් පාසලට උපකරණ ලබාදීම (ඩෙස්/පුටු)
XIX. රංවල ශ්‍රී සුගතානන්ද දහම් පාසලට උපකරණ ලබාදීම (පොත් තබන කබඩ්)
XX. රංවල වැව සහ පන්සල අසල වීථි පහන් යෙදවීම
XXI. එළමල්ප බෝධිමළු විහාරයට යන මාර්ගයේ වීථි පහන් යෙදවීම
XXII. නැකැත්වලකඩ මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් කිරීම
XXIII. ඉඹුලහේන උඩරංවල මාර්ගය කොන්ක්‍රීට් කිරීම
XXIV. අකරැල්ල වතුයායේ අක්කර 7 කොටසේ හා පහළ කොටසේ අවදානම් ගස් ඉවත් කිරීම
XXV. රංවල දිවුලකඩ මාර්ගයේ මුල් කොටස් කොන්ක්‍රීට් කිරීම

ගරු මන්ත්‍රීතුමා විසින් සභාගත කරන ඉහත යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.උපුල් වසන්ත කුමාර මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී

සිය යෝජනා සම්බන්ධයෙන් වැඩිදුරටත් කරුණු පැහැදිලි කල ගරු මන්ත්‍රී තුමා මහෝමාර ,තලගස්කන්ද මාර්ගයේබහුකාර්ය ගොඩනැගිල්ල ඉදිරිපිට මාර්ගය පැත්තක් කඩාගෙන ගොස් ඇති බැවින්,එම ස්ථානයට ඉතා ඉක්මනින් පැතිබැම්මක් යෙදීම අවශ්‍ය බවත් ,රංවල ළඟිරු පෙරපාසලේ අවදානම් තත්වය පිළිබඳ සභාවේ අවධානය යොමු කර ඊට විසඳුමක් ලබා දෙන ලෙසත් විශේෂයෙන් ඉල්ලා සිටියේය.රංවල ළඟිරු පෙර පාසලේ අනාරක්ෂිත තත්වය හේතුවෙන් දැනට පෙරපාසල රංවල විහාරස්ථානයේ පවත්වාගෙන යනු ලබන අතර රංවල වැව විහාරස්ථානය ආසන්නයේ පවතින නිසා දරුවන්ගේ ආරක්ෂාව සම්න්ධයෙන් ගැටළුවක් පවතින බව සඳහන් කළේය.

මෙම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී තුමා විසින් ඉදිපත් කරන ලද XXIV යෝජනාව සම්බන්ධයෙන් සභාවේ විශේෂ සාකච්ජාවකට බඳුන් විය.එහි සඳහන් පරිදි අකරැල්ල වතු යායේ අක්කර 7 කොටසේ ජීවිත හා දේපල වලට අනාරක්ෂිත ගස් ඉවත් කිරීම ඉතා ඉක්මනින් සිදුවිය යුතු බවත් පසුගිය දිනක අනතුරු දායක පොල් ගසක ගෙඩියක් වැටීමෙන් කුඩා දරුවෙකු ජීවිතක්ෂයට පත්වීම ඉතා අවාසනාවන්ත සිදුවීමක් බවත් පෙන්වාදීමෙන් අනතුරුව එම ගස් ඉවත් කිරීමට සභාවේ මැදිහත්වීම

ලබාදීමට තීරණය කරන ලද අතර ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කල සියළු යෝජනා සභාවේ ඒකමතික එකඟතාවෙන් යුතුව සහා සම්මත විය.

## 5.9.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී. උපුල් වසන්ත කුමාර මැතිතුමා

මෙම පළාත් පාලන බල ප්‍රදේශය තුල ජීවත් වන ජනතාවගේ සුභසාධන කාර්යන් අතර අත්‍යවශයෙන්ම ඉටු කල යුතු පහත සඳහන් යෝජනා ගරු මන්ත්‍රීතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

I. බටදූර විදුහල අසල සිට දෙනිපල්ල දක්වා දෙල්වලකන්ද මාර්ගය දෙපස කැළෑව ඉවත් කිරීම
II. හත්තැල්ල සෞඛ්‍ය මධ්‍යස්ථානය අසල සිට තැන්නයාය මාර්ගය දෙපස කැළෑව ඉවත් කිරීම
III. යකුපිටිය හන්දියේ සිට බටදූර විදුහල දක්වා මාර්ගයේ දෙපස කැළෑව ඉවත් කිරීම
IV. නරිස්ස මහින්ද මහතාගේ නිවස අසල සිට බස්නකන්ද මාර්ගය හා බටහේන මාර්ගය දෙපස කැළෑව ඉවත් කිරීම
V. කිරඹ පනන්කන්ද මාර්ගය හා පන්නිල මාර්ගය දෙපස කැළෑව ඉවත් කිරීම
VI. බටේවෙල මාර්ගයේ යකුපිටිය කොටසේ මීටර් 60 ක් පමණ කොන්ක්‍රීට් කිරීම
VII. බටදූර පන්සල මාර්ගය දෙපස කැලෑව ඉවත් කිරීම
VIII. මල්මීකන්ද තැන්නකුඹුර ප්‍රජා ශාලාව අසල වීථි පහනක් සවි කිරීම
IX. ලියනගොඩ වසමේ පොල්වත්ත පාර පැතිබැම්ම ඉදිකිරීම (ආර්ථික සංවර්ධන නිලධාරීතුමියගේ නිවස අසල)
X. උඩවෙල වල්ලකැටිය මාර්ගය දෙපස කැළෑව ඉවත් කිරීම
XI. දන්දෙනිය කොරටුවේගොඩ මාර්ගය දෙපස කැළෑව ඉවත් කිරීම
XII. හත්තැල්ල හත්තැලිහෙල මාර්ගය දෙපස කැළෑව ඉවත් කිරීම

ඉහත යෝජනා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්ලිව්.සුමනාවති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ඉතා කාලෝචිත බැවින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අදහස් කරන බවත්,එවන් අවස්ථා වල සභා කම්කරුවන්ගේ සහයට අමතරව ගම්වාසීන්ගේ සහයෝගයද ලබා ගත හැකි නම් මාර්ගය දෙපස කැලෑ එළිකර යාවත්කාලීන කර ගැනීමට වඩාත් පහසුවන බවත් ප්‍රකාශ කළේ ය.ඒ අනුව ඉදිරියේ දී වැඩසටහන් සංවිධානය කිරීමට තීරණය කරමින් ගරු මන්ත්‍රීතුමාගේ යෝජනා සභාවේ ඒකමතික එකඟතාවෙන් යුතුව සහා සම්මත කරන ලදී.

## 5.10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඒ.ඩබ්ලිව්. සුමනාවතී මැතිතුමිය

I. කරගහයට සිට තැන්නහේන මංසන්ධිය දක්වා පනවා ඇති වරිපනම් බදු අහෝසි කිරීම
II. උඩවෙල නගරයට පොදු වැසිකිළියක් ඉදිකිරීම
III. කරගහයට සිට තැන්නහේනගම කෙළවර දක්වා ඇති මාර්ගය කොන්ක්‍රීට් කර ඇති අතර, පාර අවසානයට අඩි 1.5 ක් පළල අඩි 08 ක් දිග හියුම් පයිප්ප 02 ක් ලබා ගැනීම

මේ සම්බන්ධව වැඩි දුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රී තුමිය කරගහයට සිට තැන්නහේන මංසන්ධිය දක්වා මාර්ගය ඉතා දුෂ්කර බවත් එහි ජීවත් වන ජනතාව දැඩි අවදානම් තත්ව යටතේ ජීවිකාව ගෙවන බවත්,ඒ මධ්‍යයේ වරිපනම් බදු ගෙවීම අපහසු බවත් ප්‍රකාශ කරන ලදී.වරිපනම් බදු පනවා ප්‍රකාශයට පත් කරණ ලද ප්‍රදේශවල වරිපනම් බදු විෂය භාර ගරු අමාත්‍ය තුමාගේ අනුමැතියකින් තොරව කපා හැරීමට නෛතික බලයක් නොමැති බැවින් ඒ සඳහා ඉල්ලීමක් විෂය භාර ගරු අමාත්‍ය තුමාගේ අනුමැතිය සඳහා

ඉදිරිපත් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදුව එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ. රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.

## 5.11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ. රෝහණ විජේරත්න මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත සඳහන් යෝජනා සභා ගත කරන ලදුව එම යෝජනා පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

I. අක්කර 18 සුසාන භූමිය සංවර්ධනය කිරීම
II. අක්‍රීය වීථි පහන් අළුත්වැඩියා කිරිම

## 5.12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය

ගරු න්ත්‍රීතුමිය විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. ඌරාවල විද්‍යාල මාවත කොන්ක්‍රීට් කිරීම.
II. ගොඩකවෙල තැන්න නව ගම්මානය සඳහා ජල ව්‍යාපෘතියක් ලබා දිම.
III. පොළ භූමියේ වැසිකිළි කැසිකිළි අළුත්වැඩියාව.

මෙම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

බල ප්‍රදේශයේ මාර්ග බොහොමයක් විනාශවීමට හේතු වී ඇත්තේ බර වාහන හා තේ දළු රැගත් වාහන නිරන්තරයෙන් ධාවනයේ යෙදීම නිසා බව ප්‍රකාශ කල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා,ව්‍යාපාර කටයුතු සඳහා යෙදෙන වාහන අයිතිකරුවන්ගෙන් යම් බදු මුදලක් අය කිරීමේ වැඩ පිළිවෙලක් සකස් කිරීම සුදුසු බව පෙන්වා දුන් අතර,ඉහත යෝජනා සභාවේ එකඟතාව ඇතිව සම්මත විය.

## 5.13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය

I. හපුගස්තැන්න පනාන,හපුගස්තැන්න,උඩගම මාර්ගය ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස යොජනා කල අතර,
II. සඳගනාගම ප්‍රජාශාලාව නවීකරණය කිරීම හා පැවති පුස්තකාලය යලි නඟා සිටුවිය යුතු බව යෝජන කළාය.

එම යෝජනා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම අවස්ථාවේ දී වැඩි දුරටත් කරුණු පැහැදිලි කල ගරු මන්ත්‍රීතුමිය,ප්‍රදේශයට සම්පතක්ව පැවති සඳගනා ගම පෙර පාසලේ වර්තමාන පාලනය තුල පෙර පාසලකට පමණක් සීමා වී ඇති බවත්,ප්‍රදේශයේ සමිති සමාගම් වල අවශ්‍යතා සඳහා ඉඩකඩ ලබා ගැනීමට නොහැකි බවටත්,කරුණු අනාවරණය කරමින් පෙර පාසල පවත්වාගෙන යාමට අමතරව,අනෙකුත් පොදු අවශ්‍යතා සඳහා ඉඩකඩ සලසාදිය යුතුබවටත්,පුස්තකාලය යළි ආරම්භ කල යුතු බවටත් කරන ලද යෝජනාව සභාවේ ඒකමතික එකඟතාවයෙන් යුතුව සභා සම්මතවිය.

## 5.14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා

මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දැනට පවතින ළදරු පාසල් ,පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන,දිවා සුරැකුම් මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම සහ ඒවායේ සේවය කරන පාලිකාවන්ගේ වෘත්තීය ගුණත්වය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් සියළුම පෙර පාසල් පාලිකාවන් ඒකරාශී කොට සංගමයක් පිහිටුවීම හා පෙර පාසල් පද්ධතියක් ගොඩ නැගීමට සභාවේ මැදිහත් වීම ලබා දෙන ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා විසින් ස්ථිර කරනු ලැබීය.

අනතුරුව ගරු මන්ත්‍රීතුමා විසින් එකී යෝජනා සම්බන්ධයෙන් වැඩිදුරටත් කරුණු අනාවරණය කරමින්, ඇතැම් පෙර පාසල් පාලිකාවන් රැකියා විරහිත භාවයෙන් මිදීම සඳහා පෙර පාසල් ආරම්භ කරනු ලබන අතර දරුවන්ගේ අනාගතය වෙනුවෙන් මූලික පදනම සකස් වන්නේ මුල් ළමා විය අවදියේ බැවින් එහි දී සිදුවන ක්‍රියාකාරකම් දරුවෙකුගේ සාර්ථකත්වය කෙරෙහි බලපාන බව අනාවරණය කල ගරු මන්ත්‍රීතුමා මෙම පළාත් පාලන බල ප්‍රදේශය තුල පවතින පෙර පාසල් නියාමනය කිරීමට සභාවේ මැදිහත් වීම ලබා දෙන ලෙස කරන ලද යෝජනාවට සභාවේ එකඟතාවය ලැබුණු අතර,

පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරවීම පිණිස එම යෝජනා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීමට තීරණය විය.

- එකී ස්ථාන පවත්වාගෙන යාම පිණිස ප්‍රමාණවත් භෞතික පහසුකම් නොමැති වීම.
- නිසි පුහුණුවක් ලද පාලිකාවන් නොමැති වීම.
- එකී ස්ථාන නිසි අධීක්ෂණයක් හෝ පරිපාලනයක් හෝ ලියාපදිංචියක් නොමැති වීම.

## 5.15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩී. බුද්ධික වීරසිංහ මැතිතුමා

I. පහලගම්මැද්ද ක්‍රීඩා පිටිය සභාවට පවරා ගෙන සංවර්ධනය කර,එම ක්‍රීඩා පිටිය‘‘ එම්.සිමියොන් ‘‘නාමයෙන් ප්‍රසිද්ධ කරන ලෙස යෝජනා කරන ලදී.
II. රංවල සති පොළ භූමියේ පවතින ගොඩනැගිලි ඉවත් කර කඩ කාමර සකස් කර බදු දීම සුදුසු බවත්.එමගින් සභාවේ ආදායම් මාර්ග සකසා ගත හැකි බවද අදහස් පල කල ගරු මන්ත්‍රීතුමා
III. සියළු ධුරධාරීන් සඳහා නිල හැඳුනුම්පතක්, රබර් මුද්‍රාවක් සහ ලිපි ශීර්ෂ මුද්‍රණය කර ලබා දීම සුදුසු බවත්, යෝජනා කරන ලදී.

එම යෝජනා ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු සභා සම්මත විය.

- මෙම අවස්ථාවේදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.ප්‍රසාද් අසිත මැතිතුමාගේ පැමිණීම සිදුවිය.

## 6. කාරක සභා වාර්තා සලකා බැලීම.

### 6.1. 2018.04.26 වන දින පැවති මුදල් හාප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව

කාරක සභාවේ ආවරණ අනුමැතියට යටත්ව කරනු ලැබූ තීරණ අංක 01 -අංක 27 දක්වා වූ වියදම් සහ එදින කාරක සභාවට යොමු කරන ලද අංක 28 -37 දක්වා වූ වියදම් මහ සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

### 6.2. 2018.04.25 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව

2018.04.26 දින පැවති ප්‍රසම්පාදන කමිටුව විසින් පහත සඳහන් මිලදී ගැනීම් වෙනුවෙන් ලබා ගත් තීරණ මහ සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

**(අ) තණකොළ කපන යන්ත්‍රයක් මිල දී ගැනීම.**

සරත්චන්ද්‍ර හාඩ්වෙයාර් වෙතින් (men) වර්ගයේ තණකොළ කපන යන්ත්‍රයක් ලබා ගැනීම.මුදල රු.16,500/=

**(ආ) සභාවේ ජල ව්‍යාපෘති සඳහා අවශ්‍ය ජලනල සහ ජල උපාංග ලබා ගැනීම**

ජලනල සහ ජල උපාංග ලබා ගැනීම සඳහා පහත සඳහන් ආයතන වලින් මිල ගණන් ලැබී තිබුණ අතර ගුණාත්මක බවින් යුක්ත නැෂනල් වර්ගයේ ජල උපාංග සඳහා මිළ ගණන් ඉදිරිපත් කර තිබූ විජේකාන්ත හාඩ්වෙයාර් වෙතින් රු. 237,575/= ක් වටිනා උපාංග සහ සැම්ඩැම් ආයතනයෙන් රු. 88,743.85/= ක් වටිනා උපාංග මිලදී ගැනීම.

මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතන

| | | |
|---|---|---|
| විජේකාන්ත හාඩ්වෙයාර් | - | දෙල්ගස්හන්දිය |
| සරත්චන්ද්‍ර හාඩ්වෙයාර් | - | බළන්ගොඩ |
| සැම්ඩැම් කන්ස්ට්‍රක්ෂන් | - | බළන්ගොඩ |
| සිලෝන් ලංකා පුද්.සමාගම | - | කොළඹ 10 |
| ශිරෝන් හාඩ්වෙයාර් | - | හුණුවල |

**(ඈ) වීපී පහන් හා ඊට අදාල උපාංග මිලදී ගැනීම**

අවම මිල ඉදිරිපත් කර ඇති සදිශ එන්ටප්‍රයිස් වෙතින් රු.3748.00/=ක් වටිනා උපාංග ලබා ගැනීම.

**(ඇ) RD 9402 දරණ ට්‍රැක්ටර් රථය සඳහා බැටරියක් මිලදී ගැනීම**

RD 9402 අංක දරණ ට්‍රැක්ටර් රථට පැනසොනික් වර්ගයේ බැටරියක් රු.23,450/=කට හුණුවල සදිශ එන්ටප්‍රයිස් වෙතින් ලබා ගැනීම.

**(ඉ) LL 7615 අංක දරණ කෘෘ කැබ් රථය සඳහා බැටරියක් මිලදී ගැනීම**

LL 7615 අංක දරණ කෘෘ කැබ් රථය සඳහා පැනසොනික් වර්ගයේ බැටරියක් හුණුවල සදිශ එන්ටප්‍රයිස් වෙතින් රු.29,000/= ට මිලදී ගැනීම.

**(ඊ) උතුරු හුණුවල ජල ටැංකියට පූට්වැල් 2ක් ලබා ගැනීම.**

උතුරු හුණුවල ජල ටැංකියට පූට්වැල් 2ක් රත්නපුර A.N.G. එන්ප්‍රයිස් වෙතින් රු.7,800/=කට ලබා ගැනීම.

## 7. ආදායම් වියදම් වාර්තා

### 7.1. 2018.මාර්තු මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය (රුපියල්) | | වැය සාරාංශය (රුපියල්) | |
|---|---|---|---|
| වරිපනම් බදු | 555,444.56 | වැටුප් හා දීමනා | 2,277,202.58 |
| කුලී | 137,897.88 | ගමන් වියදම් | 13,620.00 |
| බලපත්‍ර ගාස්තු | 174,000.00 | සැපයුම් හා උපකරණ | 81,706.00 |
| සේවා සඳහා ගාස්තු | 165,981.40 | ප්‍රාග්ධන වත්කම් අළු.හා නඩත්තුව | 60,851.75 |
| වරෙන්තු ගාස්තු | 2,910.00 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 60,810.35 |
| වෙනත් ආදායම් | 18,261.08 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | 394,935.91 |
| වෙනත් ආධාර | 2,018,054.36 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 3,072,549.28 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ,හා පාරිතෝෂික | 16,850.80 |
| මූලධන ලැබීම් | 15,930.00 | පුනරාවර්තන වියදම් එකතුව | 2,905,977.39 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | 15,930.00 | ප්‍රාග්ධන වැය | - |
| පුනරාවර්ථන ප්‍රාග්ධනආදායම් එකතුව | 3,088,479.28 | ණය ආපසු ගෙවීම් | 159,471.61 |
| සේවක ණය | 40,887.78 | සේවක ණය | 530,000.00 |
| තැම්පත් | 406,355.03 | තැන්පත් | 345,961.89 |
| අත්තිකාරම් | 1,000.00 | ණයහිමි | - |
| ණය ගැති(කර්මාන්ත) | 821,796.12 | අත්තිකාරම් | 127,219.78 |
| වෙනත් ලැබීම් එකතුව | 1,270,038.93 | ජල ගබඩා | 294,509.36 |
| - | - | ගබඩා(ඖෂධ) | 99,326.25 |
| - | - | වෙනත් ගෙවීම් එකතුව | 1,397,017.28 |
| මුළු එකතුව | 4,358,518.21 | මුළු ගෙවීම් | 4,462,466.28 |

## 7.2. 2018මාර්තු මස හිඟ ආදායම් අය කිරීමේ ප්‍රගතිය

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2017.12.31 ට හිඟ | 2018 වර්ෂයේ ඇස්තමේන්තුගතආදායම | 2018.03.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමටඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදලරු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| 1 | වරිපනම් බදු 1.11 | 4703281 | 1940000 | **171619** | **4%** | **573483** | **30%** | **1366517** | 4531662 |
| 2 | අක්කර බදු 1.12 | 71142 | 20900 | **8106** | **11%** | **5611** | **27%** | **15289** | 63036 |
| 3 | සැපයුම්කරුවන් ලියාපදිංචි නිරීම1.43 | | 125000 | | | **99175** | **79%** | **25825** | |
| 4 | ව්‍යාපාරබදු 2.16 | | 255000 | - | | **169800** | **67%** | **85200** | |
| 5 | වෙළෙඳබලපත්‍ර ගාස්තු2.31 | | 730000 | - | | **591000** | **81%** | **139000** | - |
| 6 | පරිසරබලපත්‍ර ගාස්තු2.37 | | 30000 | | | **4500** | **15%** | **25500** | |
| 7 | ලියාපදිංචිසහතික හා පරීක්ෂණ ගාස්තු | | 458000 | | | **41899** | **9%** | **416101** | |
| 8 | ජලගාස්තු 4.14 | 1868941 | 6075000 | 975174 | **52%** | **574730** | **9%** | **5500270** | 893767 |
| 9 | විකුණුම් | | 497000 | | | **41500** | | | |
| 10 | යන්ත්‍රකුළියට දීම3.25(2)/3.25(3) | | 1050000 | | | **77850** | **7%** | **972150** | |
| 11 | වාහනනැවතුම්පල ගාස්තු 5.43 | | 300000 | | | | **0%** | **300000** | |
| 12 | ගොඩනැඟිලිබලපත්‍ර3.43(4) | | 250000 | | | **12423** | **5%** | **237577** | |
| 13 | පොදුවෙළඳපලකුළී | | | | | | | | |
| 14 | මස්කඩමාළු කඩ කුළී 5.23(2) | 178393 | 428000 | 108861 | **61%** | **51800** | **12%** | **376200** | 69532 |
| 15 | ප්‍රමාද ගාස්තු | | 110000 | | | **20866** | **19%** | **89134** | |
| 16 | විනෝද බදු 6.15 | | 1000 | | | **-** | **0%** | **1000** | |
| 17 | සතිපොළගාස්තු5.23(1) | 25880 | 254000 | 0 | **0%** | **66260** | **26%** | **187740** | 25,880 |
| | නිවාස කුළී | | | | | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 18 | | | | | | | | | |
| 19 | දැන්වීම්පුවරු ගාස්තු1.37 | | 400000 | | | **1000** | **0%** | **399000** | |
| 20 | ජලබවුසරය කුළියට දීම 4.25 | | 300000 | | | **51000** | **17%** | **249000** | |
| 21 | ක්‍රීඩාපිටිය කුලියට දීම 6.25 | | 2000 | | | **0** | **0%** | **2,000** | |
| **22** | වෘත්තීය බලපත්‍ර 1.33 | | **100** | | | **-** | **0%** | **100** | |
| **23** | පොලී ආයෝජන 1.61 | | **500** | | | | **0%** | **500** | |
| **24** | සේවකණය පොලී1.64 | | **40000** | | | **11101** | **28%** | **28899** | |
| **25** | අයකරගතහැකි ගාස්තු2.43 | | **25000** | | | **1150** | **5%** | **23850** | |
| **26** | සභාවසතු ගොඩනැගිලි3.25.1 | | **1000** | | | **1,500.00** | **150%** | **(500)** | |

| **අනුඅංකය** | **ආදායම් ප්‍රභවය** | **2017.12.31 ට හිඟ** | **2018 වර්ෂයේ ඇස්තමේන්තුගතආදායම** | **2018.03.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය** | | **මෙමවර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල** | | **අයකිරිමටඇති ඉතිරිය** | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | **මුදල රු.** | **ප්‍රතිශතය** | **මුදලරු.** | **ප්‍රතිශතය** | **ඇස්තමේන්තු ගත ආදායමෙන්** | **හිඟයන්** |
| **27** | දඩ අනවසරඉදිකිරීම් 3.52 | | **500** | | | **-** | **-** | **500** | |
| **28** | අයකර ගත හැකි ගාස්තු 4.43 | | **1000000** | | | **271000** | **27%** | **729000** | |
| **29** | විශේෂසැපයුම් සදහා ගාස්තු4.16 | | **5000** | | | **-** | **-** | **5000** | |
| **30** | පොළහුමිය කුලියට දීම5.25 | | **1000** | | | **300.00** | **0.30** | **700** | |
| **31** | ක්‍රීඩාපිටි ටකරන් මඩු කුලියටදීම6.25 | | **2000** | | | **0** | **0%** | **2000** | |
| | **වෙනත් ආදායම්*** | **15279** | **878140** | **15279** | **100 %** | **137615** | **16%** | **740525** | |
| | මුළු එකතුව | **6837036** | **15179140** | **1279039** | **19%** | **2805565** | **18%** | **11918075** | **5583877** |

වෙනත් ආදායම්*

| අනුඅංකය | ආදායම් ප්‍රභවය | 2017.12.31 ට හිඟ | 2018 වර්ෂයේ ඇස්තමේන්තුගතආදායම | 2018.03.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙමවර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමටඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදලරු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| 1 | ලියාපදිංචිකිරීමේසහතික හා පරීක්ෂණ ගාස්තු | | | | | | | | |
| 2 | ඉඩම්හා ගොඩනැගිලි බදු දීම් | | | | | | | | |
| 3 | පාපැදි බලපත්‍ර 1.35 | | 150 | | | - | 0% | 150 | |
| 4 | වරිපනම්සංශෝධන ගාස්තු | | | | | | | | |
| 5 | වැසිකළිකුලියට දීම | | | | | | | | |
| 6 | කසලඉවත් කිරීමේ ගාස්තු 2.13 | 5000 | 107000 | 5,000.00 | 1.00 | 7,000 | 7% | 100000 | - |
| 7 | සභාභූමිය කුලියට දීම | | | | | | | | |
| 8 | පාරවල්පළුදු වීම වෙනුවෙන් ගාස්තු | | | | | | | | |
| 9 | නොපවරවාගැනීමේ සහතික ගාස්තු 3.43.(1) | | 200000 | | | 21000 | 11% | 179000 | |
| 10 | පුස්තකාලසේවා ගාස්තු 6.43 | | 15000 | | | 960 | 6% | 14040 | |
| 11 | පුස්තකාලදඩ 6.52 | | 20000 | | | 1724 | 9% | 18,276 | |
| 12 | ඉඩම්විකිණීම මත බදු | | | | | | | | |
| 13 | ඉඩම් බදු 3.24 | 10279 | 448390 | 10279 | 100 % | 89531 | 20% | 358859 | - |
| 14 | වෙළෙඳ ස්ථානකුලී03.22 | | 87600 | | | 17400 | 20% | 70,200.0 | |
| | එකතුව | 15279 | 878140 | 15279 | 100 % | 137615 | 16% | 740525 | - |

## 8. වෙනත් කරුණු

### 8.1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩී. බුද්ධික වීරසිංහ මැතිතුමා

රංවල රෝහලේ සේවක පුරප්පාඩු හේතුවෙන් දෛනික සේවා කටයුතු අඩාලව පවතින බවත්, එම නිසා ප්‍රදේශයේ ජනතාව දැඩි අපහසුතාවයට පත්ව ඇති බවත්,ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමා එම රෝහලේ පවතින අඩුපාඩු ඉතා ඉක්මනින් සම්පූර්ණ නොකලහොත් ජනතා විරෝධතාවක් මතුවිය හැකි බවද සඳහන් කළේය.

එම රෝහලේ දන්ත ශල්‍යාගාරය මුළුමනින්ම වසා ඇති බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ. දමිත් විජේරත්න මැතිතුමා අදහස් දැක්වීමෙන් අනතුරුව රංවල රෝහලේ පවතින ගැටළු නිරාකරණය කිරීමට මැදිහත් වන ලෙස පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ගෙන් ඉල්ලීමක් කිරීමට තීරණය විය.

### 8.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී. සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

i. අකරැල්ල වතුයායේ පිහිටි පොල් ගසක ගෙඩියක් වැටීම නිසා එහි පදිංචි කුඩා දරුවකු මියයාමේ සිද්ධියක් සම්බන්ධයෙන් සභාවට කරුණු ඉදිරිපත් කල ගරු මන්ත්‍රීතුමා මෙවැනි සිද්ධියකට මුහුණ දීමට සිදුවූයේ වතු නිවාස වලට අනතුරුදායකව පවතින ගස් ඉවත් කිරීමට වතු සමාගම පියවර නොගැනීම බව අවධාරනය කරමින් අනතුරුදායකව පවතින ගස් ඉවත් කිරීමට පියවර ගන්නා මෙන් වතු අධිකාරී වෙත නියෝගයක් නිකුත් කරන මෙන් ඉල්ලා සිටියේය.

ii. පල්ලෙගම ප්‍රදේශයේ ජීවත්වන ආර්.එම්.කමලාවතී මව සහ පුතා දැඩි ආර්ථික අපහසුතා මධ්‍යයේජීවිකාව ගෙවන අතර ඔවුන්ගේ නිවසේ මුළුතැන්ගෙය කඩා වැටී ඇති බැවින් එය සකස් කරවා ගැනීමට ටකරං තහඩු කිහිපයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටියේය.

### 8.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්. කුමාර මැතිතුමා

i. අයාලේ යන ගවයන් නිසා බොහෝ අවස්තාවල රිය අනතුරු පවා සිදුවේ. එබැවින් ගව අයිතිකරුවන් ඒ පිළිබඳ සැලකිල්ලක් නොදක්වන බැවින් අයාලේ යන ගවයින් සම්බන්ධයෙන් නීත්‍යානුකූල පියවරක් ගැනීම සුදුසු බව සඳහන් කළේය.

ii. දෙල්ගස්හන්දියෙන් ආරම්භ වන ගල්කන්ද මාර්ගය සහ කට්ටංගේ මාර්ගය දැඩි ලෙස අබලන් වීම නිසා ගමනාගමන අපහසුතා රැසක් මතුව තිබේ. එබැවින් එම මාර්ගය යථා තත්වයට පත් කිරීම සඳහා අදාල ආයතන වෙත ඉල්ලීමක් යොමු කළ යුතු බව ප්‍රකාශ කළේය.

iii. ප්‍රජා ජල සහ සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ ආරම්භ කර ඇති සියලුම ජල ව්‍යාපෘති වල පවතින යම් යම් ගැටළු හේතුවෙන් ඒවායේ අක්‍රමිකතා හටගෙන ඇති බවත් ඉදිරියේදී මුහුණපෑමට සිදුවන ජල ගැටළු වලට මුහුණ දීමට නම් ජල සම්පත රැක ගතයුතු බවත් පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා බල ප්‍රදේශයේ සියළුම කොට්ඨාශ තුල පවතින ප්‍රජා ජල ගැටළු නිරාකරණය කරමින් ජල මනු හරහා ජලය බෙදාදීමේ ක්‍රමවත් වැඩ පිළිවෙක් කොට්ඨාශ තුල ක්‍රියාත්මක කිරීමට මන්ත්‍රීතුමන්ලාගේ සහ මන්ත්‍රීතුමියන්ලාගේ සහය ලබාදෙන ලෙස ඉල්ලීමක් කළේය.

## 8.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය

පසුගිය දිනෙක පැවති අධික වර්ෂාව හේතුවෙන් ඌරාවල මාර්ගය අවහිර කරමින් පෙරලී තිබූ පස් හා ගල් ඉවත් කිරීමට ගරු සභාපතිතුමාගේ මැදිහත්වීම ලබාදීම සම්බන්ධයෙන් ප්‍රදේශයේ සියලු ජනතාව වෙනුවෙන් සිය ප්‍රණාමය පලකර සිටියාය.

## 8.5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්දික මැතිතුමා

බල ප්‍රදේශය පුරා අවසරයකින් තොරව ප්‍රදර්ශණය කර ඇති දැන්වීම් පුවරු නිසා පරිසරය අවලස්සන වී ඇති බැවින් දැන්වීම් ප්‍රදර්ශණය කරවීමට පුවරු කීපයක් නගර ආශ්‍රිත ස්ථාන වල සවි කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේය.

## 8.6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා

i. කටුපත්ඔය ආශ්‍රිතව දිරා රාත්‍රී දෙකේම මහ පරිමාණයෙන් වැලි ඇදීම නිසා ඒ ආශ්‍රිත ගස් හා ඉවුරු කඩා වැටී විශාල හානියක් සිදුවී ඇති බවට කරුණ අනාවරණය කළ ගරු මන්ත්‍රීතුමා එම වැලි ලොරි රථ වලින් පිට පළාත් වලට ප්‍රවාහනය කරන බවද ඒ හරහා විවිධාකාරයේ ජාවාරම් සිදුවන බවද පැවසුවේය.

ii. ණය මුදලක් හෝ ලබා ගෙන වහන්නුගේආර නැමති අක්කර 28ක පමණ වපසරියක් ඇති වැවක් ඉදිකිරීමෙන් කුඹුරු අක්කර 520 ක් පමණ අස්වැද්දිය හැකි බවත්,කුඹුරු යායන් වලට ජලය රැගෙන යාමේ අතර මග කුඩා විදුලි බලාගාර දෙකක් පමණ ඉදි කල හැකි බවත්,එමඟින් සභාවට ආදායමක් උපයා ගත හැකි බවත්,පෙන්වා දෙන ලදී.

## 8.7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී. සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා

i. ජල පෝෂක ප්‍රදේශ ආශ්‍රිතව කුඹුක් පැල සිටුවීමටත් ප්‍රදේශයේ විහාරස්ථාන පදනම් කරගෙන රුක් රෝපණ වැඩසටහන් දියත් කිරීමටත් අදහස් කර ඇති බැවින් සුදුසු ස්ථාන හඳුනාගැනීමට සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලීමක් කළේය.

ii. වැලි ප්‍රවාහනය කරන ලොරි රථ විශාල වශයෙන් ප්‍රදේශයේ පාරවල් වල ධාවනය වීම නිසා එම පාරවල් දැඩි ලෙස අබලන් වන බැවින් ලොරි රථ වලින් යම්කිසි බදු මුදලක් අය කිරීමේ වැඩ පිළිවෙලක් සකස් කළයුතු බව අවධාරණය කළ ගරු මන්ත්‍රීතුමා එමගින් සභාවේ ආදායම් තත්වය වැඩි කර ගැනීමටත් හැකිවන බව ප්‍රකාශ කළේය. එමෙන්ම සභාවේ ආදායම් තත්වය ඉහල දැමීම සඳහා නව ආදායම් උත්පාදන මාර්ග සකස් කළ යුතු බවත් පෞද්ගලික උපකාරක පන්ති පැවැත්වෙන ස්ථාන ලියාපදංචි කර ගාස්තු අය කිරීම , සංචාරක ව්‍යාපාරිකයන් මගින් ගාස්තු අයකිරීම ඒ අතරින් කීපයක් බව පෙන්වා දුන්නේය.

**සභා රැස්වීමේ නිමාව**

අද දින සභාවේ කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා සහය පලකල සියලු දෙනාටම ස්තූතිය පලකල ගරු සභාපතිතුමා සබරගමුව පළාත් සභාවේත් මධ්‍යම රජයේත් මූල්‍යමය අනුග්‍රහයන් ලබාගෙන මෙම සභාව ශක්තිමත්ව ඉදිරියට ගෙනයාම සඳහා කටයුතු කරන බව ප්‍රකාශ කරමින් සියලු දෙනාටම සුබ දවසක් ප්‍රාර්ථනා කර සභාවේ කටයුතු පස්වරු 1.30ට පමණ නිමාවට පත්කරන ලදී.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,
සභාපති,
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව.